**වෙරුගල් ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

වෙරුගල් ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු 03ක් මත පොලී එකතුව රු. 312,518ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදි අදාල දෝෂ නිවැරදි කරනු ලැබේ. | අදාල පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු. 199,350ක වාහන ටයර් සහ බැටරි ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදි නිවැරදි කරනු ලැබේ. | ස්ථාවර වත්කම්වලින් ඉවත් කළ යුතුය. |
| (ඇ) | විමසීම් කාර්යාලය (Call Centre) ප්‍රතිසංස්කරණය සඳහා රු.668,614ක් වැය කර තිබු නමුත් ස්ථාවර වත්කම් ලෙස රු.613,698ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වටිනාකම රු.54,916කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඊළඟ වර්ෂයේ ස්ථාවර වත්කම්වල එකතු කර නිවැරදි කරනු ලැබේ. | ස්ථාවර වත්කම්වල ඇතුළත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| **126** වගන්තිය | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ස්ථාපිත කළ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරිමට පියවර ගනු ලැබේ. | පනතට අනුකූලව අතුරු ව්‍යවස්ථා සම්මත කර ගාස්තු අයකළ යුතුය. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ X | ආදායම් සහ වියදම් පිළිබඳ තොරතුරු අයවැය සැලැස්ම සමග සසඳා විචලනයන් සඳහා | ඊළඟ මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව ප්‍රකාශ සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිච්ඡේදයේ 193 වගන්තිය | පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික අයවැය සමග සසඳා විචලනයන් සඳහා වගුවක් පිළියෙල කර අමුණනු ලැබේ. | |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත්කර වර්ෂ 2ක ඉක්ම වූ රු.224,352ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු කටයුතු සිදුකර නොතිබුණි. | ඊළඟ මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිරවුල් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | **2016** දෙසැම්බර් **29** දිනැති අංක **30/2016** දරන රාජ්‍ය පරිපාලන සහ කළමනාරකණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවේ භාවිතයේ පවතින වාහන 07කට ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරිභෝජනය පරීක්ෂාවක් සිදුකළ යුතුය. |
| (ඉ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත් පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව අන්තර්ජාල පහසුකම් සලසා දිය යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,060,101ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,222,602ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**-----------------------**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** වරිපනම් බදු හා බදු<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ පිහිටි දේපළ සඳහා වරිපනම් බදු හා බදු අයකිරීම් සිදු නොකෙරේ. | ඉදිරිකාලයේදි මේ පිළිබඳව පියවර ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනතේ ප්‍රකාරව වරිපනම් බදු අයකිරීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

(ආ) කුලි

-------

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් රු.666,570 ක් වටිනා කඩකාමර හිඟකුලි, පානීය ජලය බෙදාහැරීමේ ගාස්තු සහ යන්ත්‍ර හිඟකුලි ආදිය සම්බන්ධයෙන් අදාල පුද්ගලයින් හඳුනාගත නොහැකිව වර්ෂ 03 සිට 10ක් දක්වා කාලයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් මේ පිළිබඳව පියවර ගනු ලැබේ. | අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.7,561,413ක් වූ ස්ථාවර තැන්පතු 09ක් වර්ෂ 4 සිට 12ක් දක්වා කාලයක් සභාවේ අරමුණු සඳහා භාවිතා නොකර රඳවාගෙන තිබුණි. | අදාල තැන්පතු ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රයන්හි ආයෝජනය කිරීමට පියවර ගනු ලැබේ. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි ආයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවට අයත් කඩකාමර 13ක වාර්ෂික කඩකුලි ආදායම් රු.766,400ක් වුවත්, රු.511,820ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මාස 03ක කඩකුලි වට්ටම් ලබාදුන් අතර එක් කඩකාමරයක් වෙළෙඳාමේ මන්දිගාමී තත්ත්වය හේතුවෙන් වසා ඇත. මේ හේතුවෙන් රු.254,380ක කුලී ආදායම් අඩු වී තිබුණි. | වර්ෂයට අදාල සම්පූර්ණ කුලි ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | එකතුව රු.672,690ක විවිධ ණය හිමි ශේෂ වසර 08 කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි. | ඊළඟ වර්ෂයේ මෙයට අදාල ලියකියවිලි ලැබූ විට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ණයහිමි ශේෂ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ජාතික ප්‍රතිපත්තියට අනුව අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී කාබනික පොහොර සැකැසීම සඳහා ආණ්ඩුකාර අරමුදලින් රු.485,000කට මිලදී ගත් Multi copper යන්ත්‍රය ඵලදායි ලෙස යොදවා නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර ලෙස සැකැසීමේ සැලැස්ම වර්තමානයේ ක්‍රියාත්මක කෙරේ. මළ සැකැසීමෙන් පසුව බෙදාහරිනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් විධිමත් කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කළ දිගුකාලීන සහ කෙටිකාලීන ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,622,391ක් වැය කර තිබූ නමුත්, ආදායම් ලෙස කිසිවක් උපයාගෙන නොතිබුණි. | අදාල ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කර එහි අරමුණු ළඟාකර ගැනීමට ප්‍රයත්න දරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මගින් ආදායම් ඉපැයිය හැකි පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණේ කාරණා 05ක් සඳහා පමණි. | අනෙකුත් අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට පියවර ගනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා පනවා, අදාළ කටයුතු නියාමනය කළයුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 6,437,869ක වියදමකින් මාර්ග 12ක් බොරළු දමා ප්‍රතිසංස්කරණය කර තිබුණි. නමුත්, නියමිත CBR>20 තත්ත්වයේ බොරළු දැමීම තහවුරු කිරීමේ පරීක්ෂාවක් සහ පීඩනය පරීක්ෂා කිරීම සිදුනොකිරීම නිසා මාර්ගවල ගුණාත්වය තහවුරු කළ නොහැකිව පවතින අතර මේ හේතුවෙන් ඉදිරි වර්ෂයන්හිදි මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අරමුදල් යෙදවීමට සිදුවිය හැකි තත්ත්වයක් ද උද්ගත විය හැකි බව නිරීක්ෂණය විය. | ඉදිරි කාලයේදි CBR තත්ත්වය තහවුරු කිරීමේ වාර්තා ලබාගෙන මාර්ග ඉදිකිරීමට පියවර ගනු ලැබේ. | එම මාර්ග ඉදිකිරීමේදි එහි තත්ත්වය තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්**<br>ප්‍රාථමික මට්ටමේ තනතුරු 10ක පුරප්පාඩුත්, ද්විතියික පදනමේ නිලධාරී මට්ටමේ තනතුරු 04ක පුරප්පාඩුත් වශයෙන් පුරප්පාඩු 14ක් පිරවීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණත් විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | වර්තමානයේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකරනු ලැබේ. | උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |